# වාරණ විරෝධය හා පතරංග ටෙලිනාට්‍ය වාරණය

ඇතැම් පඬිවරුන් සංස්කෘතික විවිධත්වයක් ගැන කතාකරද්දී ඇතැම්හු මුළු ලෝකයට ම එක ම සංස්කෘතියක් තිබිය යුතු යැයි කියති. ජෛවීය විවිධත්වය මෙන් ම සංස්කෘතික විවිධත්වය ද අවශ්‍ය වෙයි. වසර කිහිපයකට පෙර මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ ජන්ම ශත සංවත්සර අනුස්මරණ රැස්වීමේ දී ද අපි මේ අදහස් පළ කෙළෙමු. එක් සංස්කෘතියක් පමණක් ලෝකයේ තිබුණහොත් පැන නැගිය හැකි යම් ප්‍රශ්නයකට ඒ සංස්කෘතියෙහි පිළිතුරු නොතිබුණහොත් මිනිසුන් වඳ වී යෑමට ඉඩ ඇති බව අපි එදා පෙන්වා දුන්නෙමු.

අනෙක් අතට ලෝකයේ තිබිය යුත්තේ එක් සංස්කෘතියක් පමණක් නම් ඒ සංස්කෘතිය කුමක් විය යුතු ද? ඒ ඒක සංස්කෘතිය ලෝකයේ ඇති **සියළු** සංස්කෘතීන් මිශ්‍රකර තනාගන්නා සංස්කෘතියක් ද? ඒ මිශ්‍රණය තනාගන්නේ කෙසේ ද? එසේ තනාගැනීමේ දී අප ඒ ඒ සංස්කෘතියෙන් කෙතරම් ප්‍රතිශතයක් ගන්නේ ද? ඇතැම් සංස්කෘතීන්ගෙන් අඩු ප්‍රතිශතයක් ලබාගැනීමෙන් ඒ සංස්කෘතීන්ට මදි පුංචිකමක් වේ ද? ඇතැම් සංස්කෘතියකින් කිසිවක් නොගතහොත් ඒ සංස්කෘතිය වඳ කිරීමක් ඉන් අදහස් නො වන්නේ ද?

විවිධ සංස්කෘතීන් තිබීම හා ඒ ඒ සංස්කෘතීන් අතර ගැටුම් ඇතිවීම ගැන අයෙක් කතාකරති. තම තමන්ගේ සංස්කෘතීන් ගැන කතාකරමින් අනෙක් සංස්කෘතීන් සමග ගැටුම් ඇතිකරගැනීම මුළු ලෝකයට ම එක් සංස්කෘතියක් පමණක් තිබීමෙන් වළක්වාගත හැකි යැයි කල්පනාකරන්නෝ ද වෙති. එහෙත් එක් සංස්කෘතියක් නොව සිංහල නමින් වුව ද, එක් සංස්කෘතියක් නැතැයි කියන්නන් ඇති බව අපි කලින් දුටුවෙමු. ඔවුන්ට අනුව දකුණේ සිංහලයන් කතාකරන භාෂාව උඩරට සිංහලයන් කතාකරන භාෂාවෙන් වෙනස් වෙයි. නැතහොත් ඒ ඒ අයගේ කෑම බීමවල හැසිරීම් රටාවල ආදී වශයෙන් වෙනස්කම් වෙයි. එවිට සිංහල නමින් සංස්කෘතියක් නැතැයි මේ පඬිවරු අපට පවසති. ඒ එසේ නම් මුළු ලෝකයට ම එක ම සංස්කෘතියක් ඇතිවන්නේ කෙසේ ද යන ප්‍රශ්නය ඔවුන්ගෙන් ඇසිය හැකි ය.

එහෙත් එයට අමතර ව සත්භාවයෙන් මුළු ලෝකයට ම එක ම සංස්කෘතියක් ඇතිකර ගැනීමට වෙහෙසවන අය ද සිටිය හැකි ය. ඇතැම් පඬිවරුන් මෙන් නොව ඔවුන් සිංහල නමින් සංස්කෘතියක් තිබෙන බව පිළිගන්නා අය විය හැකි ය. එහෙත් එවැන්නන් මේ ඒක සංස්කෘතිය ඇතිකරන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට පිළිතුරක් දී නැත. ලෝකයේ සියළු සංස්කෘතීන් ඊනියා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුග්‍රහයෙන් රැස්වී මේ එක් සංස්කෘතිය ගොඩනගා ගන්නේ ද? එහි දී යොදාගන්නා නිර්ණායක කවරේ ද? එහෙත් එයටත් වඩා ප්‍රශ්නය වන්නේ නිර්ණායක තෝරාගැනීමට යෑමේ දී ය. ඒ නිර්ණායක තෝරාගන්නේ කිනම් සංස්කෘතියක ද? නිර්ණායක ද සංස්කෘතියෙන් ස්වායත්ත නොවන බව තේරුම්ගත යුතු ය. සංස්කෘතියෙන් ස්වායත්ත වූ හොඳ, නරක, ආචාර ධර්ම ආදී කිසිවක් නැත. සංස්කෘතීන් රාශියක මිනීමැරීම නරක දෙයක් ලෙස හැඳින්වෙන්නේ නම් ඉන් කියැවෙන්නේ මිනීමැරීම නරක දෙයක් ය යන්න සංස්කෘතියෙන් ස්වායත්ත බව නො වෙයි. මිනීමරා මිනීමස් අනුභව කිරීම නොකළ යුතු යැයි නොකී සංස්කෘතීන් ද තිබූ බව අමතක නොකළ යුතු ය.

අද බටහිරයෝ ලෝකයේ එකම සංස්කෘතියක් පමණක් පවත්වාගෙන යෑමට උත්සාහ දරති. ඔවුන්ට වුවමනා අනෙක් සංස්කෘතීන් නැතිකර තම බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය පමණක් පවත්වාගෙන යෑම ය. අවුරුදු පන්සියයක කාලයක් තිස්සේ ඔවුහු තම ව්‍යායාමය දිගින් දිගට ම කරගෙන යති. ඔවුන්ට එහි දී අනෙක් සංස්කෘතියක් අවශ්‍ය එහි අංගයක් හෝ අංග කිහිපයක් හෝ අවශෝෂණය කරගැනීමට පමණ ය. එසේ අවශෝෂණයකිරීමෙන් පසු ඒ සංස්කෘතීන් ඔවුන් විසින් විනාශ කරනු ලැබේ. ඔවුන්ට සිංහල හා මියන්මාර ථෙරවාද සංස්කෘතීන් තම යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අවශෝෂණය කිරීමට නො හැකි ය. එබැවින් ඔවුහු ඒ සංස්කෘතීන් විනාශකිරීමට කටයුතු කරති. ලෝකයට ම ඊනියා එක් සංස්කෘතියක්, එනම් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය, ලබාදීම සඳහා සිංහල ථෙරවාද සංස්කෘතිය නැතිකර ගැනීමට අපි කැමති වෙමු ද?

© Prof. Nalin De Silva

අද ලෝකයේ අධිපතිවාදී සංස්කෘතියක් හා ඒ විසින් නිර්මාණය කෙරෙන දැනුම් පද්ධතියක් ද වෙයි. අප පාසලේ හා විශ්වවිද්‍යාලයේ මෙන් ම විවිධ ගුවන්විදුලි හා රූපවාහිනී නාලිකාවල ද ඉගෙනගන්නේ මේ දැනුම් පද්ධතියයි. ඒ විවිධ මාධ්‍යයන් ඔස්සේ අප වෙත ගලා ඒමට සලස්වා ඇත්තේ ඔවුන්ගේ සංස්කෘතියයි. යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ලොව පුරා පැතිරවීමේ කාර්යයෙහි යෙදී සිටින බටහිරයෝ ඉතා අහිංසක බවක් අටවා ගනිමින් ගහ බැන නොගෙන එක් සංස්කෘතියක් පමණක් පවත්වාගෙන යෑම ගැන බයිලා කියති. මේ බයිලාවලට බණ යැයි කීමට අපට උගන්වනු ලැබ තිබුණේ ද බටහිරයන් විසිනි. එහෙත් වත්මන් තරුණයෝ එයට බණ යැයි  නොකියා බයිලා යැයි කියති. බයිලා යනු වත්මන් තරුණයන් අතින් බිහිවී ඇති වටිනා සංකල්පයකි. මුළු සිංහල ජාතිය ම ඒ සම්බන්ධයෙන් තරුණයන් අගය කළ යුතු ය. බටහිරයන් එක් සංස්කෘතියක් යනුවෙන් අදහස් කරන්නේ තමන්ගේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය මිස අනෙකක් නොවන බව බොහෝ දෙනාට අවබෝධ නො වෙයි. අධ්‍යාපනය මඟින් ද, විනෝදවීමේ මාර්ග මගින්ද බටහිරයෝ තම සංස්කෘතිය, ආර්ථිකය හා දේශපාලනය ලෝකය මත පටවති.

බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ඇති දෙබිඩි ස්වරූපය ගැන බොහෝ දෙනාට අවබෝධයක් නැත. ඒ සංස්කෘතියෙහි ඇතැම්විට මතුපිට පෙනෙන්නට ඇති ප්‍රජාතන්ත්‍රවාදය, සාධාරණත්වය එහි අභ්‍යන්තරයෙහි නැත. අපට පෙනෙන්නට සලස්වන්නේ එකකි. එහෙත් එහි ඇත්තේ අනෙකකි. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ව මෙහි දී අපි විස්තරාත්මක ව කරුණු කීමට අදහස් නොකරමු. බටහිර ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන ආකාරය හා එහි ව්‍යාජත්වය පිළිබඳ ව කිහිප දෙනකුට යම් හැඟීමක් ඇත.

බටහිර ප්‍රජාතන්ත්‍රවාදය යනු කිහිපදෙනකුගේ ඒකාධිකාරයකි. මේ කිහිපදෙනා අතරට යෑමේ හැකියාව ඒ සඳහා අවශ්‍ය දක්ෂතා ඇති අයට තිබේ. මේ හැකියාව ඇත්තෝ දේශපාලනඥයන් නමින් හැඳින්වෙති. දේශපාලනඥයෝ විවිධ හේතු මත දේශපාලන පක්ෂ නමින් හැඳින්වෙන සංවිධානවලට බෙදෙති. ඒ ඒ පක්ෂ (බොහෝවිට දෙකක්) විටින් විට කලින් කියන ලද ඒකාධිකාරය භුක්ති විඳිනු දක්නට හැකි ය. ජනතාවගෙන් අති විශාල බහුතරයට හිමිවන්නේ ඒ ඒකාධිකරයට "සුදුසු" පුද්ගලයන් අවුරුදු හතරකට පහකට නැත්නම් හයකට වරක් තෝරාගැනීමේ අවස්ථාව ය.

අප කලින් සඳහන්කර ඇති පරිදි වාරණය සම්බන්ධයෙන් ද තත්වය එසේම ය. වාරණය අවශ්‍ය නැත, අදහස් ප්‍රකාශකිරීමේ නිදහසට බාධාවක් ය, ආදී අදහස් පාසලේ හා වෙනත් තැන්වල ඉගැන්වෙයි. එහෙත් බටහිර රටවල ද වාරණය ක්‍රියාත්මක වෙයි. එසේ සිදුවන්නේ ඊනියා විචාරකයන්ගේ මාර්ගයෙනි. විචාරකයෝ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ආරක්ෂාවන කෘති අගයති. එහෙත් එයටත් කලින් වාරණය ක්‍රියාත්මකවන බව බොහෝ දෙනා නො දනිති. බටහිර රටවල පොතක් අලෙවි කරගැනීමට නම් පොත් ප්‍රකාශකයකු ලවා පොත මුද්‍රණය කරගත යුතු වෙයි. පොත් ප්‍රකාශකයෝ ඇතැම් පොත් මුද්‍රණය නො කරති. ඔවුන් මුද්‍රණය කරන්නේ ඔවුන් හොඳ යැයි සිතන පොත් ය. මේ ඊනියා හොඳ පොත් තෝරාගැනීමේ දී ම වාරණයක් සිදුවන බව බොහෝ දෙනා නො දනිති.

ලංකාවේ ද මේ තත්වය වෙනත් ආකාරයකට දැකිය හැකි ය. මෙරට ද පොත් ප්‍රකාශකයන්ට පොත් තෝරාගැනීම පිළිබඳ අධිකාරයක් වෙයි. පුවත්පත්වල, ගුවන්විදුලි හා රූපවාහිනි නාලිකාවල ද වාරණ සිදුවෙයි. පුවත්පතක ලිපියක් පළකරවාගැනීමේ දී බලපාන එකම සාධකය ලිපියේ ගුණාත්මක බව නො වෙයි. ගුවන්විදුලි හා රූපවාහිනී නාලිකාවල වැඩසටහන්වලට ආරාධනය කෙරෙනුයේ ප්‍රකාශ කෙරේවි යැයි සිතන අදහස්වල ගුණාත්මක භාවය ගැන පමණක් සලකාබලා නො වෙයි.

තමන් වාරණයට විරුද්ධ යැයි බෙරිහන් දෙන කලාකරුවන් යැයි කියන්නන් කටයුතු කරන්නේ කෙසේ ද? මේ කලාකරුවන්ගෙන් ඇතැම්හු විවෘත ආර්ථිකයට විරුද්ධ වෙති. විවෘත ආර්ථිකයට විරුද්ධ වෙමින් කලා කෘති වාරණයට විරුද්ධවන්නේ කෙසේ ද? විවෘත ආර්ථිකය හේතුවෙන් දේශීය ආර්ථිකයට පහරක් වදින බැවින් එයට විරුද්ධ විය යුතු යැයි ඔවුහු සිතත් ද? එසේ නම් වාරණ රහිතව කලා කෘතීන්ට ඉඩ දීමෙන් දේශීය කලාවට පහරක් වැදීමට ඉඩක් වේ ද? එසේත් නොමැති නම් පහරක් වැදීමටවත් දේශීය කලාවක් නැත් ද?

අද මේ කලාකරුවන් යැයි කියාගන්නා අය මෙගා ටෙලිනාට්‍ය නමින් හැඳින්වෙන විදේශීය පතරංග ටෙලිනාට්‍යවලට විරුද්ධවන්නේ ඇයි? මේ ඇතැම්හු සිංහලෙන් පතරංග ටෙලිනාට්‍ය නිපදවූවෝ වෙති. මොවුන්ගේ විරුද්ධත්වය

© Prof. Nalin De Silva

ආර්ථික හේතු නිසා ඇතිවූවක් ද? නැත්නම් කලා දෘෂ්ටිකෝණයකින් ඇතිවූවක් ද? එසේත් නැත්නම් ඒ දෙකම නිසා ඇතිවූවක් ද? ඒ කුමක් වුවත් විදේශීය පතරංග ටෙලිනාට්‍යවලින් තමන්ගේ පැවැත්මට හානියක් වන බව මේ ඊනියා කලාකරුවෝ දනිති. අද ඔවුන් පතරංග ටෙලිනාට්‍යවලට විරුද්ධවන්නේ තිනම් හේතුවක් නිසා යැයි කීව ද, එහි මුල ඇත්තේ තම පැවැත්ම ය.

තම පෞද්ගලික පැවැත්ම පිළිබඳ ප්‍රශ්නයේ දී ඔවුහු ඒ බව නොකියා එක්කෝ දේශීය කලාවක් ගැන කතාකරති. එසේත් නැත්නම් පතරංග ටෙලිනාට්‍යවල කලාත්මක බව නැතිවීම ගැන කතාකරති. ඒ කුමක් වුවත් ඔවුන් ඉල්ලා සිටින්නේ වාරණයකි. නිකම් වාරණයක් නොව රජය මැදිහත්වීමෙන් කරන වාරණයකි. තම පෞද්ගලික පැවැත්ම පිළිබඳ ප්‍රශ්නයේ දී වාරණයට එකඟවන මේ බොරු ප්‍රබුද්ධයෝ සංස්කෘතියේ පැවැත්ම සම්බන්ධයෙන් වාරණය කළ යුතු යැයි කී විගස දුම්මල ගත් කපු මහත්වරුන් මෙන් ක්‍රියාකරති. අපට ඇත්තේ එක් ප්‍රතිපත්තියකි. අපි එය සංගත ව යොදාගනිමු. කලින් සඳහන් කරන ලද අර්ථයෙන්, සංස්කෘතිය රැකගැනීම සඳහා වාරණය අවශ්‍ය යැයි අපි කියමු. එසේ ම ආර්ථිකය හා දේශපාලනය සම්බන්ධයෙන් ද අදාළ පරිදි වාරණ අවශ්‍ය වෙයි. එහෙත් ඒ එකක්වත් පෞද්ගලික පැවැත්ම සහතික කරගැනීම සඳහා නො වේ.

එහෙත් මෙහි දී ප්‍රශ්නයක් පැන නගී. මේ වාරණ ප්‍රතිපත්ති සකස් කළ යුත්තේ කවුරුන් විසින් ද? එයට රජය මැදිහත්විය යුතු ද? එහි දී දැන් පවත්නා අන්දමේ ඊනියා ස්වාධීන මණ්ඩලයක් පත්කිරීමට රජය කටයුතු කළ යුතු ද? මේ කරුණ අපි පැරණි සමාජය සමග සංසන්දනය කරමු. එසේ කරන්නේ බොරු ප්‍රබුද්ධයන් කියන ආකාරයට අනුරාධපුරයට ආපසු යෑමට නො වෙයි. එහෙත් අපේ ප්‍රවාද, අපේ මතිමතාන්තර ගොඩනැගීමේ දී අපේ සංස්කෘතියෙහි හිඳිමින් පැරැන්නන් කටයුතු කර ඇත්තේ කෙසේ දැයි සොයා බැලිය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva